C
374
SEN

# "නේවාසික සිසුන්ගේ අධ්‍යාපනික ගැටලු පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්: මහනුවර දිස්ත්‍රික්කයේ පාසල්වලින් තෝරාගත් නියැදියක් ඇසුරින් කෙරෙන අධ්‍යයනයකි."

UNIVERSITY OF PERADENIYA
NOV 2007
LIBRARY

කේ. එම්. සෙනෙවිරත්න.

අධ්‍යාපන දර්ශනපති උපාධි (M. Phil) නිබන්ධනය.

අධ්‍යාපන විද්‍යා අධ්‍යයනාංශය,
පේරාදෙණිය විශ්ව විද්‍යාලය,
පේරාදෙණිය.

1996/1997

613189

# පෙරවදන

80 දශකයෙන් පසු ලංකාවේ පාසල් අධ්‍යාපනයේ දැකිය හැකි විශේෂ ලක්ෂණයක් වන්නේ නගරයන් හි පවතින 1AB හා ජාතික පාසල්වලට තම දරුවන් ඇතුළත් කර ගැනීම සඳහා දෙමව්පියන් අතර දැඩි පෙළඹවීමක් මතුවී තිබීමය. විශේෂයෙන් පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීමේ දී අනුගමනය කරන නොයෙකුත් ක්‍රියාදාමයන් හා 5 වසර ශිෂ්‍යත්ව විභාගය පහසුකම් සහිත ජනප්‍රිය 1AB හෝ ජාතික පාසලකට තම දරුවා ඇතුළත් කර ගැනීම සඳහා සුදුසුකම් ලැබීමේ තරඟ විභාගයක් බවට පත්වීම මගින් මෙම තත්ත්වය වඩාත් තහවුරු වේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස තම ස්ථිර පදිංචි දිස්ත්‍රික්කයෙන් වෙනත් දිස්ත්‍රික්කයක පාසලකට හෝ තම දිස්ත්‍රික්කය තුළ වුවත් පදිංචි ස්ථානයෙන් දුර බැහැර පාසලකට තම දරුවා ඇතුළත් කිරීමට දෙමව්පියන්ට සිදුවේ. ඒ අනුව එවැනි ළමුන්ට තමන් පදිංචි නිවසේ සිට දෛනිකව පාසලට පැමිණීමට නොහැකි වේ. එබැවින් දෙමව්පියන්ගෙන් ඈත්ව නේවාසිකව පාසල් අධ්‍යාපනය ලැබීම දැකිය හැකි ලක්ෂණයකි. එසේ නේවාසික වන සිසුන්ගෙන් බොහෝ දෙනෙකු පාසල් නේවාසිකාගාරයන් හි හෝ පාසලෙන් බැහැර ස්ථානයන් හි නේවාසික වෙති. මේ අනුව 1AB හා ජාතික පාසල්වල සිසු ජනගහනයෙන් සැලකිය යුතු සංඛ්‍යාවක් නේවාසිකව අධ්‍යාපනය ලබන බව පැහැදිලි වේ.

ප්‍රවෘත්ති පත්‍ර, රූපවාහිනී හා විවිධ මාධ්‍ය මගින් දැනගැනීමට ලැබෙන ඇතැම් සිදුවීම් මගින් පැහැදිලි වන්නේ නේවාසිකව පාසල් අධ්‍යාපනය ලබන සිසුන් නේවාසික වීම නිසාම ගැටළුවලට මුහුණපාන බවය. ලංකාවේ පාසල් සිසු ජනගහනයෙන් සැලකිය යුතු කොටසක් නේවාසික අධ්‍යාපනය ලැබුවන් ඉහත සඳහන් කළ පරිදි ඔවුන්ට ගැටළු ඇති බව පෙනී ගියත්, නේවාසික සිසුන් හෝ ඔවුන්ගේ ජීවිතය පිළිබඳ හෝ නේවාසික පහසුකම් පිළිබඳව හෝ පර්යේෂණ සිදු කර නොමැති බව සාහිත්‍ය විමර්ශනයේ දී අනාවරණය විය. මෙය එම සිසුන් නොසලකා හැරීමක් වන බැවින් ඒ පිළිබඳව අධ්‍යනයක් කිරීම කාලෝචිතව අවශ්‍ය කටයුත්තක් බව පර්යේෂකයා අදහස් කරයි.

මෙම පර්යේෂණය මගින් ලංකාවේ පාසල් නේවාසිකාගාරයන්හි හෝ පාසලෙන් බැහැර ස්ථානයන්හි නේවාසිකව අධ්‍යාපනය ලබන සිසුන් නේවාසික වීමේ අවශ්‍යතාවය පිළිබඳවත්, තම අධ්‍යාපන කටයුතු කරගෙන යාමේ දී ඔවුන් මුහුණපාන ගැටළු පිළිබඳවත් විමර්ශනය කෙරේ. මෙහි දී මහනුවර දිස්ත්‍රික්කයේ නේවාසිකාගාර පවත්වාගෙන යනු ලබන තෝරාගත් පාසල් කිහිපයක නේවාසික සිසුන්ගෙන් ලබා ගත් නියැදියක් මගින් මෙම අධ්‍යයනය සිදු කෙරේ.

මෙම පර්යේෂණය විස්තරාත්මක පර්යේෂණයකි. මෙහිදි විස්තරාත්මක සංඛ්‍යාන ශිල්ප ක්‍රම යොදාගෙන ඇති අතර ප්‍රමාණාත්මක පර්යේෂණ ක්‍රමය බොහෝ දුරට යොදාගෙන ඇත.

පර්යේෂණයේ පළමු පරිච්ජේදයේ ගැටලුව හැඳින්වීම, මතෘකාවට අදාළ සංකල්ප හඳුන්වා දීම, අධ්‍යයනයේ අරමුණු හා අධ්‍යයනයේ වැදගත්කම, අධ්‍යයනයේ සීමා යන කරුණු ඇතුළත් වේ.

දෙවන පරිච්පේදය පර්යේෂණ සාහිත්‍ය සඳහා වෙන්වේ. සාහිත්‍ය විමර්ශනයේදි අනාවරණය වු කරුණක් වුයේ නේවාසික පාසල් සිසුන් පිළිබඳ ලංකාවේ අධ්‍යයනයන් සිදුකර නොමැතිවීමය. එබැවින් ඊට අදාළ විදේශීය පර්යේෂණ සාහිත්‍ය පමණක් ඉදිරිපත් කෙරේ.

තුන්වන පරිච්ජේදය පර්යේෂණයට අදාළ න්‍යායාත්මක පදනම ඉදිරිපත් කෙරේ. ඒබ්‍රහම්. එම්. මාස්ලෝගේ අවශ්‍යතා න්‍යාය පර්යේෂණයේ න්‍යායාත්මක පදනම බැවින් එම න්‍යාය ඇතුළත්වන මානවවාදි පර්යාලෝකය පිළිබඳවත් එම මානවවාදි පර්යාලෝකය ඉදිරිපත් කළ අධ්‍යාපන මනෝවිද්‍යාඥයින් පිළිබඳවත් තොරතුරු ඉදිරිපත් කෙරේ. මෙහිදි මාස්ලෝගේ අවශ්‍යතා න්‍යාය තරමක් විස්තරාත්මකව ඉදිරිපත් කර ඇත. අවසානයේ මාස්ලෝගේ අවශ්‍යතා න්‍යාය පර්යේෂණයට අදාළව න්‍යායාත්මක පදනම ලෙස තෝරා ගැනිමේ යෝග්‍යතාව සඳහන් කෙරේ.

හතරවන පරිච්ඡේදය පර්යේෂණ භූමිය, පර්යේෂණ ජනගහනය, නියැදිය, දත්ත ලබාගැනීම සඳහා භාවිත කළ මුනිගේ (Mooney) ගැටලු සැසඳුම් ලැයිස්තු පර්යේෂණ කාර්යයට යොදාගැනීමේ යෝග්‍යතාව හා වලංගුභාවය පිළිබඳවත් තොරතුරු ඉදිරිපත් කෙරේ. එමෙන්ම උක්ත පර්යේෂණයේදී දත්ත රැස්කිරීමට යොදගත් උපකරණ වන ගැටලු සැසඳුම් ලැයිස්තුව හා දත්ත විශ්ලේෂණය සඳහා යොදගනු ලැබූ සංඛ්‍යාන ශිල්ප ක්‍රම පිළිබඳව ද අදහස් ඉදිරිපත් කෙරේ.

පස්වන පරිච්ජේදයේ දී ලබාගත් දත්ත විශ්ලේෂණය හා අර්ථකතනය කිරීම කෙරේ. මෙහිදී නියැදිය කාණ්ඩ හතරකට බෙදා එකිනෙක කාණ්ඩ දෙක බැගින් ගෙන සංසන්දනාත්මක විග්‍රහයක් සිදු කෙරේ. එම කාණ්ඩ හතර වන්නේ පාසල් නේවාසිකාගාරගත සිසුවියන්, පාසල් නේවාසිකාගාරගත ශිෂ්‍යයන්, පාසලෙන් බැහැර ස්ථානයන්හි නේවාසික සිසුවියන්, පාසලෙන් බැහැර ස්ථානයන්හි නේවාසික ශිෂ්‍යයන් යන ලෙස වේ. දත්ත විශ්ලේෂණයේ දී කල්පිත පරීක්‍ෂාව, ප්‍රස්තාර සටහන් විග්‍රහය, විශ්‍රම්භ මට්ටම් විග්‍රහය සහ අවම හා උපරිම සීමා විග්‍රහය යන සංඛ්‍යාන විද්‍යාත්මක ශිල්පීය ක්‍රම යොදගෙන ඇත. මෙසේ ශිල්පීය ක්‍රම හතරක් භාවිතකර ඇත්තේ අනාවරණය කරගන්නා තොරතුරු සඳහා වැඩි විස්වාසනීයත්වයක් ද ලබාදීමේ අරමුණින් ය.

6 වන පරිච්ජේදය දත්ත විශ්ලේෂණය තුළින් මතුවූ අනාවරණ මත පැමිණිය හැකි නිගමන හා යෝජනා ඉදිරිපත් කෙරේ. ඒ අනුව අවසන් නිගමනය වන්නේ නේවාසිකව පාසල් අධ්‍යාපනය ලබන සිසුන්ගෙන් වැඩි දෙනෙක් නේවාසික පරිසරයට අනුගත වීම, භෞතික පහසුකම් පවුල හා පුරුදු පරිසරයෙන් ඈත් වීම සහ විවේකය හා විනෝදාත්මක කටයුතු ආශ්‍රිත ගැටලු සඳහා වැඩි වශයෙන් මුහුණපාන අතර පාසල් පරිසරය , ආර්ථික, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ආශ්‍රිත ගැටලු සඳහා අඩු සංඛ්‍යාවක් මුහුණ පාන බව ය. නේවාසිකව පාසල් අධ්‍යාපනය ලබන සිසුන්ගේ ජීවිත වලට සම්බන්ධ සියලු අංශ ඔවුන්ගේ ගැටළු පිළිබඳ වැඩි අවධානයක් යොමු කර ඒවා විසඳීමට පියවර ගැනීම අවශ්‍ය බව අවසානයේ යෝජනා කෙරේ.

# Preface

After eighties one of the main features we notice in the education field in Sri Lanka is, the trend to send the children to 1AB schools in the cities and to the National schools. Various criteria in selecting the students to grade one, the transformation of the grade 5 scholarship exam to a competitive exam to admit the students to popular 1 AB schools or the National Schools, proves the above factor. As a result the parents are forced to admit their children to a school in another district or to a far away school in the same district. Thus the children are unable to attend the school daily from home. So the children have to separate from the parents and boarded to attend schools. Most of the students are boarded in the school hostels or in nearby houses. Due to this a considerable number of the students population of 1 AB and national schools are boarders.

According to newspapers, television and other multimedia, the students face many problems due to being boarded in the literary review, it is revealed that in Sri Lanka no one has done any research regarding schooling boarders, their lives or their boarding facilities, although undergo many problems. In this way the boarders are neglected. So the researcher thinks it is time to carry out a study on this issue.

In this research, the researcher finds out the necessity to be boarded, and the problems they face as boarders in their studies.

The research was done with a sample taken from few Kandy schools where there are hostels.

This is an analytical research. Hence descriptive statistical scientific method is been used while to a certain extent quantitative research method is also been used.

In the first chapter, introduction to the topic, the concepts related to the topic, the importance, the aims and the limits of the research are being discussed.

In the second chapter, the literary review is been presented. Since no one has done any research on the schooling boarders in Sri Lanka, only the foreign literature has been included here.

In the third chapter, the theoretical foundation of the research is been presented. Agraham M. Maslow's Needs theory is the theoretical foundation of the research.

Therefore the researcher takes about the humanistic perspectives that includes Maslow's Needs Theory, and about the educational psychologists who presented humanistic perspective. Hence Maslow's Needs Theory is explained to a certain extent. The suitability to select Maslow's Needs Theory as the theoretical foundation of the research, is been discussed finally.

In the forth chapter details about, the research fields the research population, the sample and the suitability to use Mooney's Problem Check list to collect data in the research are presented.

The analysis of data and the definition are presented in the fifth chapter. The sample is decided into four categories. Each category is compared to one other category, analytically. Hostel girls, hostel boys, girls who are boarded outside the school, boys who are boarded outside the school are the four categories. Hypothesis tests, graph analysis, analysis of the confidence levels, analysis of the minimum and maximum limits, are the statistical scientific methods that were used to analyze data. In this way four methods were used to bring about a better validity to the revealed information.

In the sixth chapter the conclusion and suggestions based as the revealed information through the data analysis. Thus the most of the schooling boarders face the problems of physical facilities, adaptation to the boarding environment, leisure and entertainment activities and being away from their native places. A few of them face the problems for the economic, learning and teaching and the school environment problems. At last the main proposal for who responsible of schooling boarders' lives, must be paid more attention their problems and taken to steps to solve them.